**කාර්මික තාක්ෂණ ආයතනය - 2015**

**------------------------------------**

කාර්මික තාක්ෂණ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ vii කොටසේ 40 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 **විගණකගේ වගකීම**

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කාර්මික තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) යුරෝපා සංගමයේ මූල්‍ය ආධාර යටතේ ආරම්භ කළ ව්‍යාපෘතියක් ගිවිසුම්ගත පරිදි ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් සිදු වූ අලාභ පියවීම සඳහා රු. 13,279,398 ක් යුරෝපා සංගමය වෙත ආපසු ගෙවීමට 2014 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය දක්වාම මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය වෙන්කිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආදායම් ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය රු.230,988 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රකාශන මඟින් ගෙවිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබියදී, සමාලෝචිත වර්ෂයේදී ජාත්‍යන්තර සංගමයක් වෙත 2013 වර්ෂයේ වාර්ෂික දායක මුදල රු.1,081,924 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් අතීතානුයෝගීව ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදලින් ලැබූ පොළී ආදායම රු. 744,659 ක් අඩුවෙන් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණ අතර, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් රු.7,975,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2000 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වූ කාලය වෙනුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබූ සනාථ කිරීම් අනුව ගෙවිය යුතු එකතු කළ අගය මත බදු මුදල රු.10,475,428 ක් ලෙස දක්වා තිබුණද, මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.2,475,723 ක් වීමෙන් වූ රු.7,999,705 ක වෙනස හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් අයිතම් පහක හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොග වටිනාකම් භෞතික සත්‍යාපන වාර්තා හා මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම් සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු. 40,280,486 ක හා රු.639,461 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වූ වර්ෂ 01ත් 05ත් අතර අගරු චෙක්පත් හා වෙනත් ණයගැතියන් පිළිවෙලින් රු.70,185 ක් හා රු.2,679,331 ක් විය. එම ශේෂයන් සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවයෙන් ඉවත්ව ගිය හා සේවයේ රැඳී සිටින නිලධාරීන් සඳහා ගෙවිය යුතු හිඟ වැටුප් සඳහා 2009 වර්ෂයේදී රු.7,030,873 ක වෙන් කිරීමක් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ඉන් රු. 6,980,352 ක් ගෙවීමට කටයුතු නොකර ඉතිරි වී තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියෙන් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.240,226,000 ක් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ඡේදයේ 9:1 වගන්තිය | අමාත්‍ය මණ්ඩලයේ පූර්ණ අනුමැතියකින් තොරව වර්ෂයක කාලයක් සඳහා විශ්‍රාමික නිලධාරියෙකු තාක්ෂණ පැවරුම් උපදේශකයකු වශයෙන් පත් කර සමාලෝචිත වර්ෂය සඳහා දීමනා වශයෙන් රු.793,990 ක් ගෙවා තිබුණි. |
| (ඇ) 2011 අප්‍රේල් 21 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2011/1 දරන මුදල් හා ක්‍රම සම්පාදන චක්‍රලේඛය. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.2,443,833 ක් වටිනා කොරියානු ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණි. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය | වටිනාකම රු.13,581,898 ක පරිගණක මෘදුකාංග හා උපාංග සහ වටිනාකම රු.4,512,594 ක අනෙකුත් වත්කම් භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. |

(ඉ) 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

| | |
|---|---|
| (i) 1 වගන්තිය | පනතේ දක්වා ඇති පරිදි සාමාන්‍ය කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන්ම දිරි දීමනා ගෙවිය නොහැකි වුවද, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් රු.11,427,864 ක් හා රු.7,597,411 ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ii) 7.1 වගන්තිය | උපදේශන සේවා ආදායමින් ඍජු පිරිවැය අඩු කළ පසු සියයට 10 ක සිට සියයට 25 ක් දක්වා ප්‍රතිශතයක මුදලක් ආයතනයේ රඳවාගෙන ඉතිරිය භාණ්ඩාගාරයේ විශේෂ අරමුදලක් වෙත මාස 03කට වරක් යැවිය යුතු වුවත් එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඊ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය 06 (iii) ඡේදය | පර්යේෂණ දීමනා ලබා ගැනීමට නිත්‍ය රාජකාරියට බාධා නොවන පරිදි අතිරේක පර්යේෂණ කටයුතු සිදුකල යුතු බව දක්වා තිබුණද, ආයතනයේ සාමාන්‍ය රාජකාරී යටතේ ඉටු කරනු ලබන පර්යේෂණ අදාල කරගෙන සමාලෝචිත වර්ෂයේදී රු.9,494,405 ක පර්යේෂණ දීමනාවක් ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.26,282,796 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.55,698,487 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.29,415,691 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය රු.40,000,000 කින් වැඩි වුවද සේවක පාරිශ්‍රමික වියදම රු. 65,654,026 කින් හා ක්ෂය රු.13,140,727 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේ දී රු.59,318,986 ක් වූ අතිරික්තය 2012 වර්ෂය වන විට රු.22,628,443 ක් දක්වා අඩු විය. එසේ වුවද 2013 වර්ෂයේදී ආරම්භ වූ අතිරික්තයේ වර්ධනය 2014 වර්ෂයේදී රු.55,698,487 ක් වූවද, නැවත 2015 වර්ෂය වන විට රු.26,282,796 ක් දක්වා අඩුවී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී ආයතනයේ දායකත්වය 2011 වර්ෂයේදී රු.359,862,461 ක් වූ අතර 2012 වර්ෂයේදී යම් පසුබෑමකට ලක් වී, පසු වර්ෂවලදී අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේ දී එය රු.434,404,485 ක් විය.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ජංගම අනුපාතය පිළිවෙලින් 6.16 හා 5.15 ක් වූ අතර, ක්ෂණික අනුපාතය 6.04 හා 5.03 ක් විය. සමාලෝචිත වර්ෂයේදී ජංගම වත්කම් ඉහල යාම කෙරෙහි, මාලඹේ ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සඳහා ලද මුදල් රඳවා තබා ගැනීම හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

------------------

1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතට අනුව, ශ්‍රී ලංකාවේ තාක්ෂණය වේගවත් කාර්මීකරණය සඳහා අවශ්‍ය තාක්ෂණ මට්ටමට උසස් කිරීම කාර්මික තාක්ෂණ ආයතනයේ ප්‍රධාන අරමුණ වූ අතර ඒ සඳහා පහත කාර්යයන් ඉටු කිරීම ආයතනය වෙත පැවරී තිබුණි.

(අ) කර්මාන්තවලදී භාවිතා කරන තාක්ෂණ ක්‍රියාවලින් හා ක්‍රම දියුණු කිරීම සඳහා ක්‍රියාවලීන් හා ක්‍රමෝපායන් සොයා ගැනීම, පරීක්ෂණ, විමර්ෂණ හා පර්යේෂණ ගිවිසුම් මත භාර ගැනීම, තාක්ෂණ සේවා හා උපදේශන සේවා සැපයීම සහ තාක්ෂණ පැවරීම්, තාක්ෂණ අනුවර්තන, නව තාක්ෂණ සංවර්ධනය කිරීමේ කටයුතුවල නිරතවීම මගින් කර්මාන්තවලට සහයවීම.

(ආ) කාර්මික තාක්ෂණ සංවර්ධනය වේගවත් කිරීමේ අදහසින් පර්යේෂණ පවත්වා ගෙන යාම.
"ෂෙල්fප් තාක්ෂණය" පිළිබඳ තොරතුරු එකතු කිරීම, සකස් කිරීම සහ ප්‍රචලිත කිරීම.

(ඇ) ආයතනය ලබා ඇති පලපුරුද්දට අනුව අදාල අංශවල තැනැත්තන් පුහුණු කිරීම.

(ඈ) පරිසර දූෂණය පිළිබඳ සමාලෝචනය හා සමීක්ෂණ කිරීමේ කටයුතුවලට සම්බන්ධ වී ක්‍රියා කිරීම හා අවම කිරීම සඳහා වූ ප්‍රතිකර්ම නිර්දේශ කිරීම.

(ඉ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හා ආයතන, විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල හා වෙනත් මණ්ඩල සමඟ ඉල්ලුම් බද්ධගත නිර්දේශන කටයුතුවලදී සහයෝගයෙන් කටයුතු කිරීම.

පසුගිය වර්ෂ 05 ක කාලය තුළ පේටන්ට් අයිතිය ලබාගැනීමට හැකි පර්යේෂණ 69 ක් සිදු කර තිබුණද, පර්යේෂණ 60 ක් සඳහා පේටන්ට් අයිතිය ලබාගැනීමක් හෝ තාක්ෂණික පැවරීමක් සිදුකර නොතිබුණු බව ඉහත කාර්යයන් සිදුකිරීම සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) යාපනය චුන්නාගම් ප්‍රදේශයේ සිදු කර තිබූ ජල පරීක්ෂාව පිළිබඳ ව්‍යාපෘතිය නියමිත කාලය තුළදී නිම කිරීමට අපොහොසත් වීම, ගනුදෙනුකරුගේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු නොකිරීම හා ඉදිරිපත් කර ඇති වාර්තාව අසම්පූර්ණ වීම හේතුවෙන් සේවාලාභීන් විසින් රු. 3,053,680 ක මුදල ආයතනය වෙත ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි.

(ආ) මාලඹේ ගොඩනැගිලි සංකීර්ණයෙහි පළමු අදියර (Agro Food Technology Building) අමාත්‍යාංශයේ ව්‍යාපෘතියක් යටතේ රු.832,250,000 ක් වියදම් කර 2014 වර්ෂයේදී ඉදිකිරීම් නිමකර තිබුණද එම ගොඩනැගිල්ල ආයතනයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 392 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 373 ක් විය. පුරප්පාඩු සංඛ්‍යාව 56 ක් වුවද, තනතුරු 03 ක් සඳහා අනුමත සීමාව ඉක්මවා නිලධාරීන් 07 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබා දී තිබුණි.

(ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 30 දෙනෙකු බඳවාගෙන තිබුණි. ද්විතියික මට්ටමේ තනතුරු 2ක් සඳහා ස්ථිර සේවකයින් 05 දෙනෙකු අතිරේකව සිටියදී කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් අතර 19 දෙනෙකු ද්විතියික මට්ටම සඳහා බඳවා ගෙන තිබුණි.

(ඇ) 2010 ජූනි 21 දිනැති අංක DMS/E2/24/7/173/2 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියේ විධිවිධාන අනුගමනය කරමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 12 ක් ඇති කිරීමට කටයුතු කර තිබුණි. එසේ වුවද 2012 මැයි 17 දිනැති අංක DMS/B1/62/14 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය මඟින් කාර්ය මණ්ඩලය අනුමත කර තිබියදීත් එහි සඳහන් නියෝගයන්ගෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේදී එම නිලධාරීන්ට හිමි දීමනා ගෙවීමට කටයුතු කර තිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බැංකු ජංගම ගිණුම් 03 ක හා ඉතිරි කිරීම් ගිණුම් 01 ක එකතුව රු.1,820,645 ක ශේෂයක් වසර 05 කට අධික කාලයක සිට උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ආ) මාලඹේ පරිපාලන ගොඩනැගිල්ල රු.78,280,915 ක් වැය කර ඉදිකිරීම් කටයුතු අවසන් කර වසර 05 කට වැඩි කාලයක් ගතවී තිබුණද, කිසිදු පරිපාලන කටයුත්තක් සඳහා භාවිත නොකර වසා දමා තිබුණි.

## 4.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් සපයනු ලබන තාක්ෂණ හා පර්යේෂණ සේවා මිල කිරීම සඳහා නිත්‍ය පිරිවැයකරණ ක්‍රමයක් ඇති කිරීම සඳහා 2013 වර්ෂයේදී රු.350,000 ක් පුද්ගලික ආයතනයකට ගෙවා තිබුණද, නව ක්‍රමය අනුගමනය කිරීමකින් තොරව පෙර පරිදිම මිල කිරීම් සිදු කිරීම නිසා දරන ලද වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ආ) ජාත්‍යන්තර පිළිගැනීමක් ලබාගැනීම සඳහා ආයතනයේ පරීක්ෂණාගාර ප්‍රතීතනය කිරීම ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති ආයතනයකින් සිදු කරවා ගෙන තිබූ අතර එම කාර්යයම අනුකූලතා තක්සේරු ආයතනය මගින්ද නැවත කරගැනීම හේතුවෙන්, රු.1,714,509 ක ප්‍රතීතනය ලබා ගැනීම සඳහා රු.3,349,962 ක් වැඩිපුර වැය කර තිබුණි.

## 4.6 ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013, 2014 සහ 2015 වර්ෂවලදී භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් ආරම්භ කළ වටිනාකම රු. මිලියන 11.2 ක් වූ ව්‍යාපෘති 09 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතු වුවද, එදින වන විට ඒවා අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන පිළිවෙලින් රු. මිලියන 03 ක් හා රු. මිලියන 07 ක මූල්‍ය දායකත්වයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතියක් 2014 වර්ෂයේදී ආරම්භ කර 2015 වර්ෂයේදී අවසන් කිරීමට සැලසුම් කළ ව්‍යාපෘතිය සඳහා රු. 2,114,279 ක් වැය කර ඇතත් 2016 අගෝස්තු මාසය වන විටත් එම ව්‍යාපෘති අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත්, 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 (3) ඡේදය ප්‍රකාරව ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වලින් අපේක්ෂිත නිමැවුම් ප්‍රතිඵල ඇතුලත් කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේ දී පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සඳහා රු. මිලියන 20 ක් වෙන් කර තිබුණද ඒ කුමන කාර්යයන් ඉටු කිරීම සඳහාද යන්න සැලැස්මෙහි සඳහන්ව නොතිබුණු බැවින් කාර්යසාධනය ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳීම් කිරීමට නොහැකි වී තිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් වියදම් අතර සියයට 31ක සිට සියයට 831 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 5.3 අභ්‍යන්තර විගණනය

--------------------------

2014 වර්ෂයේ සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතින අතර අභ්‍යන්තර විගණන අංශයේ නිළධාරීන් දෙදෙනෙකු පමණක් සේවයේ යෙදී සිටින බැවින් ආයතනයේ විෂය පථය සැළකීමේදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට නොහැකි වී තිබුණි.

### 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------

2011 මැයි 30 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම් නියෝග අංක 16 ප්‍රකාරව විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම්වල කොන්දේසි කඩ කළ නිළධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු රු.7,810,032 ක් 2015 දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | | ඌන උපයෝජිත වත්කම් පැවතීම. |
| (ආ) | ප්‍රසම්පාදනය | (i) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු නොකිරීම. |
| | | (ii) | ගබඩාවට භාණ්ඩ ලැබුණු පසු භාණ්ඩ ලැබීම් සටහන්, නිකුත් කිරීම හා ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කිරීම් ප්‍රමාදවීම. |
| (ඇ) | අභ්‍යන්තර විගණනය | | අභ්‍යන්තර විගණන අංශය මගින් පෙන්වා දී ඇති දුර්වලතාවයන් මගහරවා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. |
| (ඈ) | පර්යේෂණ හා ඉදිකිරීම් ව්‍යාපෘති පාලනය | | පර්යේෂණ ව්‍යාපෘති හා ඉදිකිරීම් ව්‍යාපෘති නියමිත කාලයේදී සම්පූර්ණ නොකිරීම හා ව්‍යාපෘතිවල ලිපි ලේඛන ආරක්ෂාකාරීව පවත්වා නොගැනීම. |
| (ඉ) | උපදේශන සේවා දීමනා ගෙවීම පාලනය | | උපදේශන සේවා සැපයීමට ප්‍රථම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඊ) | වැටුප් හා දීමනා | | නියමිත වැටුප් කාණ්ඩය අනුව වැටුප් හා දීමනා ගෙවා නොතිබීම. |